# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,423 — 1962 දෙසැම්බර් 7 වැනි සිකුරාද — 1962.12.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙන ම ගොනුකරගත හැකි පරිදි, සැම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 637 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 640 | අය-වැය ලේඛන ... ... ... | 648 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 643 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 643 | මාගී කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | 647 | විවිධ දැන්වීම් ... ... ... | 656 |


## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥා පණත—198 වැනි පරිච්ඡේදය

#### වැළඩ ගම් ප්‍රදේශයේ ගම්සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩ ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරණලද පහත දක්වෙන යෝජනාව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. ආර්. ඩබ්ලිව්. රාජපක්ෂ,
වැළඩ ගම්සභාවේ සභාපති.

1962 නොවැම්බර් 21 වෙනි දින,
වැළඩ ගම්සභා කාර්යාලයේ දීය.
වැළඩ.

#### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සහා පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපණතේ 3 වැනි වගන්තියේ 1 වෙනි උපවගන්තිය යටතේ වැළඩ ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් 1953 අප්‍රේල් මස 10 වෙනි දින අංක 10,517 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද පොදු අතුරු ව්‍යවස්ථා 4 වෙනි කාණ්ඩයේ 1 වෙනි අතුරු ව්‍යවස්ථාව අනුව මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියේ සඳහන් දිග හා පළල ඇතිව සාද හෝ නැවත සාද පවත්වාගෙන යායුතුයයිද, 6වෙනි ව්‍යවස්ථාවේ ප්‍රකාර වැළඩ ගම්ප්‍රදේශයේ ගම්සභාවේ සභාපතිතුමාගෙන් විධි වූ පරිදි ලියවිල්ලකින් ලබාගත් බලයක් හෝ අවසරයක් නොමැතිව පහත දක්වෙන මංමාවත් වල ලොරි බස්, සහ ටොන් එකහමාරකට වැඩිබර ඇති වෙනත් ඕනෑම වර්ගයක වාහනයක් ධාවනය කිරීම හෝ අලිඇතුන් ලවා ගල් හෝ ලී කොටන් ආදිය ඇද්දවීම නීතිවිරෝධි බවද කියා අංක 17 පරගහදෙනිය පලාතේ නියෝජිත ඇම්. ඇල්. ඒ. අසීස් මහතා කරණ ලද යෝජනාව අංක 12 අකාඩේ පළාතේ නියෝජිත ඩබ්ලිව්. ඒ. ඩී. ඇන්. විජේසිංහ මයාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

| අංකය | පාරේ නම | දිග හැ. | ද. | යාර | පළල අඩි |
|---|---|---|---|---|---|
| | **අංක 1—මොරතිහ කොට්ඨාශය** | | | | |
| 1. | හභරන්කොටාව පාර :—හුනුගල්කඩුල්ලේ නෝර්මන්ඩි ප්‍රසිද්ධ පාරේ සිට මාදුරේ කෝරළේ සීමාව දක්වා ... | 1 | 0 | 0 | 16 |
| 2. | ගලේ පාර :—හභරන්කොටාව පාරේ සිට හුනුගල් කඩුල්ල ප්‍රසිද්ධ පාරට ... ... | 1 | 0 | 0 | 08 |
| 3. | මොරතිහකන්ද පාර :—මොරතිහ මන්සන්දියේ සිට නෝර්මන්ඩි දක්වා ... ... | — | 73 | 19 | 14 |
| 4. | කටුපොල්ලන්ද පාර :—මොරතිහකන්ද පාරේ සිට දික්හේන දක්වා ... ... | — | 19 | 15 | 06 |
| 5. | මොරතිහ පාසැල් පාර :—මොරතිහකන්ද පාරේ සිට කටුපොල්ලන්ද පාර දක්වා ... ... | — | 30 | 12 | 15 |
| 6. | වෙරළුගස්පිටිය පාර :—හුනුගල්කඩුල්ල සිට මොරතිහකන්ද පාර දක්වා ... ... | — | 23 | 06 | 10 |
| 7. | මොරතිහ රජමහ විහාර පාර :—රඹබඩගල්ල ප්‍රසිද්ධ පාරේ සිට වල්පොළ ඇලට ... ... | 1 | 0 | 0 | 16 |
| 8. | මොරතිහ-බොල්ලැගල පාර :—රඹබඩගල්ල ප්‍රසිද්ධ පාරේ සිට බෙල්ලැගලගම සීමාව දක්වා ... | — | 21 | 16 | 14 |

| අංකය | පාරේ නම | දිග හැ. | ද. | යාර | පළල අඩි |
|---|---|---|---|---|---|
| | **අංක 2—හතරබාගේ කොට්ඨාශය** | | | | |
| 9. | කවිසිගමුව බොල්ලෑගල පාර :—ගෝණදෙනිය කවිසිගමුව පාරේ සිට වගුරේ කුඹුර දක්වා | — | 19 | 15 | 12 |
| 10. | උඩගම බොල්ලෑගල පාර :—ගෝණදෙනිය කවිසිගමුව පාරේ සිට ගෝණමඩ දක්වා | — | 48 | 11 | 15 |
| 11. | බොල්ලෑගල-හුනුපොලකන්ද පාර :—බොල්ලෑගල පාරේ සිට හුනුපොලකන්ද දක්වා | $\frac{1}{4}$ | 0 | 0 | 15 |
| 12. | බෝල්ලෑගල ගම මැද පාර :—බොල්ලෑගල-මොරතිහ පාරේ සිට හුනුපොලකන්ද දක්වා | $\frac{1}{4}$ | 0 | 0 | 15 |
| 13. | බොල්ලෑගල-මොරතිහකන්ද පාර :—බෙල්ලෑගල සිට වල්පොල ඇල දක්වා | — | 28 | 17 | 15 |
| 14. | දදුරුඹය පාර :—රම්බඩගල්ල පාරේ සිට කුඹල්ලන්හ දක්වා | — | 05 | 19 | 13 |
| 15. | කුකුරුළිහන පාර :—රම්බඩගල්ල පාරේ සිට කිරියාකොටුව වත්ත හරහා මල්කොටුව කුඹුර දක්වා | — | 41 | 03 | 15 |
| 16. | කුඹල්ලන්හ පාර :—රම්බඩගල්ල පාරේ සිට කුඹල්ලන්හ දක්වා | — | 12 | 03 | 12 |
| 17. | දළුපතේගෙදර පාර :—රම්බඩගල්ල පාරේ සිට අඹකොටේ දක්වා | — | 14 | 17 | 06 |
| | **අංක 3—අඹකොටේ කොට්ඨාශය** | | | | |
| 18. | දළුපතේගෙදර පාර :—කරදගොල්ල-ගෝණදෙනිය පාරේ සිට ගොරොක් ගහපිටිය කුඹුර දක්වා | — | 46 | 06 | $14\frac{1}{2}$ |
| 19. | බිලන පාර :—කරදගොල්ල-ගෝණදෙනිය පාරේ සිට ඇතුගාල කුඹුර දක්වා | — | 06 | 11 | 08 |
| 20. | අඹකොටේ පාර :—කරදගොල්ල-ගෝණදෙනිය පාරේ සිට ගමවෙල දක්වා | — | 13 | 17 | 16 |
| 21. | වැලිපත්වෙල පාර :—කරදගොල්ල-ගෝණදෙනිය පාරේ සිට කහටගොල්ල හේන දක්වා | — | 17 | 09 | 28 |
| 22. | වලහමුල්ල පාර :—අඹකොටේ හන්දිය සිට කොස්පොතු ඔය වලහමුල්ල දක්වා | — | 75 | 09 | 20 |
| 23. | වලහමුල්ල-අතුරුපාර :—කරදගොල්ල-ගෝණදෙනිය පාරේ සිට කොස්පොතු ඔය දක්වා | — | 35 | 10 | $16\frac{1}{2}$ |
| | **අංක 4—කන්දේපොල කොට්ඨාශය** | | | | |
| 24. | මී ගස්තැන්න-උඩළුපොල පාර :—හතරබාගේ සීමාවේ සිට කවිසිගමුව මල්ලියගොඩ පාරට | 1 | 16 | 11 | 20 |
| 25. | හුනුපොලගෙදර පාර :—මුංකොටුවේ සිට කන්දේපොල දක්වා | — | 06 | 19 | 09 |
| 26. | හුනුපොලගෙදර කන්දේපොල පාර :—හුනුපොලගෙදර සිට කන්දේපොල දක්වා | — | 30 | 12 | $13\frac{1}{2}$ |
| 27. | හුනුපොලගෙදර-ගල්ගොඩ පාර :—කවිසිගමුව මල්ලියගොඩ පාරේ සිට හුනුපොලගෙදර දක්වා | — | 18 | 16 | 10 |
| 28. | අංගන්මිය පාර :—කැප්පෙටිපොල පාරේ සිට අටවලල්ලේ කුඹුර දක්වා | — | 10 | 17 | $16\frac{1}{2}$ |
| 29. | දෙරණෑපොල-හුනුපොලකන්ද පාර :—කවිසිගමුව-මල්ලියගොඩ පාරේ සිට හිටිගෙදර දක්වා | — | 14 | 17 | 12 |
| 30. | හුනුපොලකන්දට යන පාර :—කවිසිගමුව-මල්ලියගොඩ පාරේ සිට හුනුපොල කන්ද දක්වා | — | 71 | 20 | $14\frac{1}{2}$ |
| 31. | හුනුපොලකන්දේ සිට බුළුවලට යන පාර :—හුනුපොලකන්දේ සිට සබරසුන්හ ඇල දක්වා | — | 23 | 07 | $14\frac{1}{2}$ |
| 32. | හුනුපොලකන්ද-බොල්ලෑගල පාර :—හුනුපොලකන්ද පාරේ සිට බොල්ලෑගල කුඩාමොරගෙල්ලෑව තෙක් | — | 26 | 13 | 14 |
| 33. | හුනුපොලකන්ද සොහොන්පිටිය පාර :—හුනුපොලකන්ද බොල්ලෑගල පාරේ සිට සොහොන් පිටිය දක්වා | — | 08 | 07 | 14 |
| 34. | හිටිගෙදර-එගොඩපිටිය පාර :—මල්ලියගොඩ-කවිසිගමුව පාරේ සිට දෙනිය දක්වා | — | 38 | 09 | 15 |
| | **අංක 5—බුළුවල කොට්ඨාශය** | | | | |
| 35. | සැහැලෙන-රන්තැටිකන්ද පාර :—සැහැලෙන හන්දියේ සිට රන්තැටි කන්ද දක්වා | 2 | 04 | 0 | 14 |
| 36. | බුළුවල-බුළුවල කන්ද පාර :—කවිසිගමුව මල්ලියගොඩ පාරේ සිට බුළුවල ටැන්කිය දක්වා | — | 63 | 14 | $13\frac{1}{2}$ |
| 37. | බුළුවල-හුනුපොල කන්ද පාර :—බුළුවලකන්දේ සිට සබරසුන්හි ඇල දක්වා | — | 63 | 01 | 14 |
| 38. | බුළුවල-පේරගස්තැන්න පාර :—බුළුවල තුඹාණේ සිට පේරගස්තැන්න දක්වා | — | 39 | 09 | 06 |
| 39. | බුළුවල-අඹකොටේ පාර :—බුළුවල තුඹාණේ සිට අඹකොටේ ගම් සීමාව දක්වා | — | 62 | 21 | 12 |
| 40. | සැහැලෙන-අඹකොටේ පාර :—බුළුවල සැහැලෙන සිට හැවැන්පොල මායිම දක්වා | $\frac{1}{2}$ | 0 | 0 | 14 |
| 41. | පොල්ගහකොටුව සුසාන භූමි පාර :—කොස්ගොල්ලපොල සිට පොල්ගහ කොටුව සුසාන භූමිය දක්වා | — | 37 | 09 | 04 |
| | **අංක 6—හැවැන්පොල කොට්ඨාශය** | | | | |
| 42. | වෙලගෙදර ගමට යන පාර :—කවිසිගමුව පාරේ සිට ගෝණදෙනිය අඹකොටේ පාර දක්වා | — | 29 | 09 | 06 |
| 43. | දෙඹගහගෙදර බුළුවල පාර :—ගෝණදෙනිය අඹකොටේ පාරේ සිට බුළුවල ගිනිගත් අංහ දක්වා | $\frac{1}{2}$ | 0 | 0 | $16\frac{1}{2}$ |
| 44. | දෙඹගහගෙදර-පල්ලේවෙල පාර දක්වා :—ගෝණදෙනිය අඹකොටේ පාරේ සිට ගෝණදෙනිය මහ ඇල දක්වා | — | 59 | 04 | 20 |
| 45. | දුම්වත්ත-කොළඹිණි පාර :—දුම්වත්ත කොළඹිණියේ සිට පල්ලේවෙල කුඹුර දක්වා | — | 73 | 11 | 14 |
| 46. | හැවැන්පොල වලහමුල්ල පාර :—ගෝණදෙනිය අඹකොටේ පාරේ සිට බඩබැද්ද දක්වා | $\frac{1}{2}$ | 0 | 0 | 15 |
| 47. | අලවලගමට යන පාර :—ගෝණදෙනිය අඹකොටේ පාරේ සිට හින්කෙන්ද දක්වා | — | 21 | 15 | 14 |
| 48. | ගෝණදෙනිය මැද කන්ද පාර :—ගෝණදෙනිය හන්දියේ සිට මැද කන්ද දක්වා | — | 50 | 13 | 19 |
| 49. | ගෝණදෙනිය පටලීය පාර :—ගෝණදෙනිය මැද කන්ද පාරේ සිට පටලීය දක්වා | $\frac{1}{4}$ | 0 | 0 | 14 |
| 50. | ෂෙකර්ලිවත්ත පාර :—ගෝණදෙනිය අඹකොටේ පාරේ සිට ෂෙකර්ලි වත්ත පාරට | — | 39 | 10 | 14 |
| | **අංක 7—කෝන්ගොඩ කොට්ඨාශය** | | | | |
| 51. | කොටාදළුපොත පාර :—පින්නලන්ද පාරේ සිට කොටාදළුපොත දක්වා | — | 04 | 17 | 12 |
| 52. | පින්නලන්ද පාර :—කොස්පොතු ඔයේ සිට පල්ලේවෙල ඇල දක්වා | — | 13 | 20 | 20 |
| 53. | වලහමුල්ල පාර :—කොස්පොතු ඔයේ සිට මැද්දේවෙල මැදින් වලහමුල්ල දක්වා | $\frac{1}{2}$ | 0 | 0 | 12 |
| 54. | බඩබැද්ද ගල්කුඹුර පාර :—ගල්කුඹුරේ සිට කෝන්ගහබැද්ද දක්වා | — | 26 | 07 | 12 |
| 55. | බඩබැද්ද අක්කර පනහ පාර :—කෝන්ගහ ළඟ සිට අක්කර පනහට | — | 29 | 10 | 12 |
| 56. | කුඹල්ගොල්ල පාර :—බඩබැද්ද පින්කුඹුර හරහා අක්කර පනහ දක්වා | — | 14 | 07 | 12 |
| 57. | බඩබැද්ද පාර :—හැවැන්පොල මායිමේ සිට අක්කර පනහ දක්වා | — | 24 | 14 | 12 |
| 58. | අලවල අක්කර පනහ පාර :—බෙරකාර කොටුවේ සිට අක්කර පනහ දක්වා | — | 24 | 14 | 12 |
| | **අංක 8—සියඹලන්ගමුව කොට්ඨාශය** | | | | |
| 59. | වතුහැර පිටිය පාර :—නල්ලූරේ හන්දියේ සිට මල්ලියගොඩ කවිසිගමුව පාරේ කඩිහාගම දක්වා | — | 51 | 02 | 13 |
| 60. | මැදගම පන්සල් පාර :—කවිසිගමුව මල්ලියගොඩ පාරේ සිට මැදගම පන්සල දක්වා | — | 25 | 09 | 13 |
| 61. | මැදගම නාරම්මළුව පාර :—මැදගම පන්සල අසල සිට කවිසිගමුව පාර දක්වා | $\frac{3}{4}$ | 0 | 0 | 08 |
| 62. | නල්ලූරේ තල්ගස්පිටිය පාර :—තල්ගස්පිටියේ ප්‍රසිද්ධ පාරේ සිට තල්ගස්පිටිය සියඹලන්ගමුව ප්‍රසිද්ධ පාරට | — | 40 | 02 | 03 |
| 63. | තල්ගස්පිටිය සියඹලන්ගමුව පාර :—තල්ගස්පිටිය ප්‍රසිද්ධ පාරේ සිට මල්ලියගොඩ කවිසිගමුව පාරට | 1 | 0 | 20 | 18 |
| 64. | වැලිකුඹුර පාර :—නල්ලූරේ තල්ගස්පිටිය ගම්සභා පාරේ සිට වැලිකුඹුර දක්වා | — | 04 | 19 | 12 |
| 65. | මැදගම අතුරු පාර :—මැදගම පන්සල් පාරේ සිට ගෝණදෙනිය ඇල දක්වා | — | 10 | 13 | 06 |
| 66. | සියඹලන්ගමුව සුසානභූමි පාර :—කවිසිගමුව පාරේ සිට සියඹලන්ගමුව මැදගම සුසාන භූමියට | — | 03 | 18 | 05 |

| අංකය | පාරේ නම | දිග හැ. | ද. | යාර | පළල අඩි |
|---|---|---|---|---|---|
| | **අංක 15—වාඩියගොඩ කොට්ඨාශය** | | | | |
| 134. | දෙය්යන්ගොඩ පාර :—නුවර පාරේ සිට දෙය්යන්ගොඩ හරහා මල්ලියගොඩ පාරට | — | 15 | 10 | 03 |
| 135. | බුජස්ලෙන පන්සල් පාර :—නුවර පාරේ සිට බුජස්ලෙන පන්සල හරහා නුවර පාරට | — | 25 | 02 | 12 |
| 136. | වාඩියගොඩ වැන්කිය පාර :—නුවර පාරේ සිට වාඩියගොඩ වැන්කිය දක්වා | — | 10 | 18 | 09 |
| 137. | ගනේගොඩ පාර :—නුවර පාරේ සිට බෝගහකුඹුර දක්වා | — | 04 | 17 | 08 |
| 138. | පහළ ගනේගොඩ පාර :—නුවර පාරේ සිට ලෝලුගම්මන පාර දක්වා | — | 42 | 15 | 15 |
| 139. | යටිවිල්ල පහළ ගමට පාර :—නුවර පාරේ සිට පහළ යටිවිල්ල දක්වා | — | 45 | 00 | 06 |
| 140. | හරන්කහගොඩ පාර :—නුවර පාරේ සිට නුවර දිස්ත්‍රික්කයේ මායිම දක්වා | 1 | 00 | 00 | 14 |
| 141. | පල්ලේගම වෙල්යායට යන පාර :—නුවර පාරේ සිට පල්ලේගම වෙල් දක්වා | — | 01 | 13 | 06 |
| 142. | මැදගොඩ පාර :—බුජස්ලෙන පන්සල පාරේ සිට මැදගොඩ වත්තට | — | 07 | 19 | 06 |
| 143. | පල්ලේගම වාඩියගොඩ පාර :—පල්ලේගම වැන්කියට යන පාරේ සිට ජාවර ගෙදරට | — | 12 | 18 | 10 |
| 144. | පල්ලේගම වැන්කිය පාර :—නුවර පාරේ සිට පල්ලේගම වැන්කිය දක්වා | — | 08 | 16 | 10 |
| 145. | කුරුවාලෙන පන්සල් පාර :—නුවර පාරේ සිට කුරුවාලෙන පන්සලට | — | 10 | 03 | 13 |
| 146. | යටිවිල්ල වැන්කිය පාර :—නුවර පාරේ සිට යටිවිල්ල වැන්කියට | — | 10 | 18 | 08 |
| | **අංක 16—වැලිගේපොල කොට්ඨාශය** | | | | |
| 147. | ඉළුක්වෙල සොහොන් පිටිය පාර :—නුවර පාරේ සිට ඉළුක්වෙල සොහොන් පිටියට | — | 08 | 13 | 12 |
| 148. | දිගනේ පාර :—නුවර පාරේ සිට දිගන දක්වා | — | 12 | 16 | 08 |
| 149. | කෙළපෙරණකන්ද පාර :—පරගහදෙනිය පරණ මුස්ලිම් පල්ලිය කුඹුරේ සිට බඩහැල වත්තට | — | 21 | 00 | 19 |
| 150. | වැලිගේපොල පාර :—පුස්සැල්ල පරගහදෙනිය පාරේ සිට වැලිගේපොල ගම හරහා පුස්සැල්ල මායිමට | — | 41 | 06 | 14 |
| 151. | පරගහදෙනිය දෙල්පද්දන පාර :—පරගහදෙනිය මායිමේ සිට කහපත්වල පාරට | — | 19 | 04 | 14 |
| 152. | දෙල්පද්දන පාර :—නුවර පාරේ සිට දෙල්පද්දන දක්වා | — | 18 | 00 | 06 |
| 153. | ඉහළ වැලිගේපොල පාර :—පරගහදෙනිය මායිමේ සිට කුරුකැප්පෙටිය දක්වා | — | 46 | 05 | 03 |
| 154. | ඉළුක්වෙල පන්සල පාර :—කහපත්වල පාරේ සිට පන්සල දක්වා | — | 03 | 00 | 10 |
| | **අංක 17—පරගහදෙනිය කොට්ඨාශය** | | | | |
| 155. | පරගහදෙනිය පාර :—නුවර පාරේ සිට පරගහදෙනිය පරණ මුස්ලිම් පල්ලියේ කුඹුර දක්වා | — | 42 | 21 | 16 |
| 156. | ඉහළ කණ්ටිගොල්ල පාර :—නුවර පාරේ සිට හෙට්ටියාවලගම හරහා දෙල්පද්දන පාරට | ½ | 00 | 00 | 08 |
| 157. | පරගහදෙනිය දෙල්පද්දන පාර :—පරගහදෙනිය පාරේ සිට දෙල්පද්දන දක්වා | — | 11 | 10 | 10 |
| 158. | කදුරුඅන්හ බෙට්ටියගොඩ පාර :—කහපත්වල පාරේ සිට කොස් පොතු ඔය දක්වා | — | 38 | 04 | 10 |
| 159. | පොල්වත්තේ පාර :—නුවර පාරේ සිට පරණ මුස්ලිම් පල්ලිය පාර දක්වා | — | 39 | 00 | 08 |
| 160. | පහළගල් ළිඳ පිටිය පාර :—නුවර පාරේ සිට ඉහළ වැලිගේ පොලට | — | 10 | 11 | 03 |
| 161. | පරගහදෙනිය වෙඩිකාරඅන්හ පාර :—පුස්සැල්ල පාරේ සිට වෙඩිකාරඅන්හට | — | 05 | 02 | 10 |
| 162. | කදුරු අන්හ පාර :—දෙල්පද්දන සිට කදුරු අන්හ දක්වා | — | 01 | 14 | 14 |
| 163. | විර්නාවල්ලිය පාර :—නුවර පාරේ සිට පොල්වත්තට | ½ | 00 | 00 | 04 |
| 164. | පොල්වත්ත පාරේ අතුරු පාර :—පොල්වත්තගම හරහා කෙළ පෙරණකන්දට | ¼ | 00 | 00 | 08 |
| 165. | ඉහළ බඩහැල කොටුව පාර :—නුවර පාරේ සිට පහමුන්දන ගම දක්වා | ½ | 00 | 00 | 04 |
| | **අංක 18—ඇරැපොලකන්ද කොට්ඨාශය** | | | | |
| 166. | ඇරැපොලකන්ද පාර :—මල්ලියගොඩ පාරේ සිට ඇරැපොලකන්දේ ඇල දක්වා | — | 69 | 15 | 14 |
| 167. | ඇරැපොලකන්ද අතුරු පාර :—ඇරැපොලකන්ද පාරේ සිට රජයේ කැලෑව දක්වා | — | 19 | 02 | 16 |
| 168. | පුස්සැලිකන්ද පාර :—පුස්සැල්ල මන්සන්දියේ ඇරැපොල කන්ද ඇල දක්වා | 1 | 48 | 00 | 14 |
| 169. | පුස්සැලිකන්ද අතුරුපාර :—මොරගහමුල සිට දෙඩන්තලාවත්ත දක්වා | — | 14 | 10 | 06 |
| 170. | ජාකඩුකන්ද පාර :—කවිසිගමුව පාරේ සිට ඇරැපොලකන්ද ඇල දක්වා | 1 | 04 | 15 | 14 |
| 171. | රත්මළ ඇලේ සිට ඇරැපොලකන්ද දක්වා | — | 61 | 06 | 14 |

12–50

# තනතුරු – ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාව කාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන් හි දී, ආණ්ඩුවේ, ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, 1946 අංක 5 දරණ පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥපනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරණ පලාත් පාලන සේවා ආඥපණතේ විධිවිධාන වලටද 1945 අංක 43 දරණ ආඥපණත පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධනවලට ද ඒ ආඥපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලට ද යටත් වන්නේ ය.

**3. සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලෙඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුරු ද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරුකර හරිනු ලැබුවහොත් ඔවුන් ගේ විශ්‍රාම වැටුප් අයිති වාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින් දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සවකීය

5. උපන් ස්ථානය—

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නුපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඈ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තිය/ශිල්පිය අධ්‍යාපනය | | |
| --- | --- | --- | --- | --- | --- |
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |
| 4. | | | 4. | | |
| 5. | | | 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමඟ—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් ඇරු තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු, පළාත් පාලනායතන හා කාල සීමාවන්) : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිත ද ? :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුනු දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම හා භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි සවභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශෙෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—කෝට්ටේ-ගල්කිස්ස ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 540—22 × 12—රු. 804, රු. 636 රු. 732 වාර්ෂික වැටුප්වලට පළවූ කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්—

(අ) වයස.—1962 දෙසැම්බර් මස 26 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් හා ඉංග්‍රීසි 4 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මංඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයින්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1962 දෙසැම්බර් මස 26 වැනි දිනට හෝ ඊට පළමු බොරලැස්ගමුව කෝට්ටේ-ගල්කිස්ස ගම් සභාවේ සභාපතිතුමා වෙත ලැබෙන්නට එවිය යුතුයි.

රූබන් පෙරේරා කෝරාළ,
කෝට්ටේ-ගල්කිස්ස ගම්සභාවේ සභාපති.

1962 නොවැම්බර් මස 28 වැනි දින, බොරලැස්ගමුව, කෝට්ටේ-ගල්කිස්ස ගම්සභා කාර්යාලයේ දීය.

12-68

### පළාත් පාලන සේවය

**සිංහල වාර්තාකරු තනතුර**

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවමින් 62.11.23 දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ හතරවැනි කොටසේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීමේ 3 වැනි ඡේදයේ—3 (සි) "ඉංග්‍රීසි භාෂාව" යන කොටස ඉවත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 62.12.18 දක්වා දීර්ඝ කරනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530, කොළඹ, 1962 දෙසැම්බර් 3 දින.

12-231

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවය

**පළාත් පාලන සේවයේ ටයිප් ශසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (ඉංග්‍රීසි) විභාගය—1962**

ඉහත සඳහන් විභාගය සඳහා අයදුම් පත් කැඳවමින් 1962.10.12 වැනි දින දරන ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සිව්වැනි කොටසේ පළ කළ නිවේදනය වැඩිදුරටත් ය.

මෙම විභාගය 1962 දෙසැම්බර් 29 වැනි දින පැවැත්වෙන බව මෙයින් දනුම් දෙනු ලැබේ. යථාකාලයේදී එවනු ලබන ප්‍රවේශ පත්‍ර වල විභාගය පැවැත්වෙන ස්ථානය පිළිබඳ තොරතුරු ඇතුළත් කරනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
**සභාපති.**

1962 නොවැම්බර් මස 27 දින,
තැ. පෙ. 530,
කොළඹ දීය.

12-287

## අතුරු ව්‍යවස්ථා

ඇල්. ඩී.—බී. 160/41.
ප. පා. ලද.—ජී. 2/172.

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ, බදුලු දිස්ත්‍රික්කයේ බෝගොඩ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. සභාපති විසින් යථා පරිදි නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් පිට මිස කිසිම තැනැත්තකු විසින් මුදල් ණයට දීමේ ව්‍යාපාරය පවත්වාගෙන නොයා යුතුය. එබඳු සෑම බලපත්‍රයක්, එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කරන ලද අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක් වැනිදට අවසන් විය යුතු ය.

2. කිසිම තැනැත්තකු විසින් මුද්දර තබා, අත්සන් කරනු ලැබීම පිණිස නිසි ලෙස අංක යෙදූ දින පොතක්, ලෙජරයක්, හා රිසිට් පොත් ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, මුදල් ණයට දීමේ ව්‍යාපාරය පවත්වාගෙන යෑම පිණිස බලපත්‍රයක් ලබාගැනීමට හිමිකම් නොලැබිය යුතුය.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්, ඒ සඳහා සභාව විසින් සපයනු ලබන ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කළ යුතු අතර—

(අ) ඉල්ලුම් පත්‍රය අලුත් බලපත්‍රයක් සඳහා නම්, ව්‍යාපාරය ආරම්භ කිරීමට අදහස් කරන දිනයට දින තිහකට නොඅඩු කලකට පෙර ද;

(ආ) තිබෙන බලපත්‍රයක් අලුත් කිරීමක් සඳහා නම්, එකී බලපත්‍රය අලුත්වැඩියා කිරීම අවශ්‍යව තිබෙන අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර් මස පළමුවැනි දින හෝ, ඊට පෙර ද සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතු ය.

4. උගස්, පොරොන්දු නෝට්ටු හා ඔඩපත පිට ණයට දෙන ලද මුදල් පිළිබඳව, මෙයට යාකොට ඇති උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූල වූ අර්ධ වාර්ෂික වාර වාර්තාවන් සැපයීම බලපත්‍රධාරියාගේ යුතුකම විය යුතුය. මේ අර්ධ වාර්ෂික වාර වාර්තා, එක් එක් අවුරුද්දේ ජනවාරි මස 15 වැනිදා හා ජූලි මස 15 වැනිදා හෝ ඊට පෙර සභාව වෙත ලැබිය යුතුය.

5. බලපත්‍රධාරියා විසින් සභාපතිට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම්කිසි තැනැත්තකුට කලින් කලට ගණන් පොත්පත් පරීක්ෂා කර බැලීමට අවසර දිය යුතුවාත් හැර, ඒ සඳහා ඔහුට වුවමනා විස්තර තොරතුරු සැපයීමෙන් සියලුම සහාය ද දිය යුතු ය.

6. මුදල් ණයට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම පිළිබඳ බලපත්‍රයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් 100ක් විය යුතු අතර, එය සෑම වර්ෂයක මාර්තු මස තිස්එක් වැනිදට පෙර ගෙවිය යුතු ය.

7. මේ අතුරු ව්‍යවස්ථා වලින් කවරක් වුවත් කඩ කරනු ලැබීම ගැන දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වැරදිකරු කරනු ලබන යම් බලපත්‍රධාරියකුට ගම්බද අධිකරණයක් මගින් දෙනු ලබන වෙන යම් දඬුවමකට අමතරව එම අධිකරණය විසින් ඔහුගේ බලපත්‍රය අවලංගු කිරීම ද නිත්‍යනුකූල විය යුතු අතර, එසේ අවලංගු කිරීම සම්බන්ධයෙන් කිසිදු වන්දියක් ලැබීමට බලපත්‍රධාරියාට හිමිකම් නොතිබිය යුතු ය.

8. මේ අතුරු ව්‍යවස්ථාවල, පද සංසන්දනයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යනුවෙන් බෝගොඩ ගම් ප්‍රදේශයේ ගම්සභාව අදහස් වේ.

"ආඥපනත" යනුවෙන් (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනත අදහස් වේ.

### උපලේඛනය

මුදල් ණයට දෙන්නාගේ නම :—

19..............දක්වා වූ කාලසීමාව සඳහා අර්ධ වාර්ෂික වාර වාර්තාවයි.

| දිනය | ඇපයේ ස්වභාවය | මුල් මුදල | | සියයට ගණන | ණයකරුගේ නම හා ලිපිනය |
|---|---|---|---|---|---|
| | | රු. | ශ | | |
| | | | | | |

..........................................
මුදල් ණයට දෙන්නාගේ අත්සන.

දිනය :..............................

12-255

ඇල්. ඩී.—බී 11/47.
ප. පා. දෙ.—ජී 2/275.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ කඳවෙල් සහ තඹගමු පත්තු (දෙපත්තු) ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹදීය.

#### අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය :—
   1. රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම.
   2. සුරුට්ටු හෝ බීඩි සෑදීම.
   3. ලී හෝ දර මඩුවක් තබා ගැනීම.

2. පහත සඳහන් කර්මාන්ත අන්තරාදායක කර්මාන්ත වශයෙන් සැළකිය යුතුය :—
   1. කොප්පරා වේලීම.
   2. තේ කර්මාන්ත ශාලාවක් තබා ගැනීම.
   3. වී මෝලක් තබා ගැනීම.
   4. රා ගබඩා කිරීමේ ස්ථානයක් තබා ගැනීම.
   5. යකඩ කම්හලක් තබා ගැනීම.
   6. ස්වර්ණාභරණ සෑදීම.

3. පහත දක්වෙන කර්මාන්ත අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය :—
   1. ගඩොල් හෝ උළු පිළිස්සීම.
   2. හුණු ගල් පිළිස්සීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබෙලි කිරීම.

12-254

---

ඇල්. ඩී.—බී 3/50.
ප. පා. දෙ.—ජී 2/151.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ පනතින් සංශොධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 42 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ හක්මන—වලකඩ ගම් ප්‍රදේශයේ, ගම් සභාව විසින් සම්පාදිතව, එකී වගන්තිය යටතේ පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ දීය.

#### අතුරු ව්‍යවස්ථා

#### ආයුර්වේද බෙහෙත් ශාලා

1. ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 36 වැනි වගන්තිය යටතේ ගම් සභාව විසින් ගම් ප්‍රදේශයේ පිහිටුවන ලද ආයුර්වේද බෙහෙත් ශාලාව ගම් සභාව විසින් ම නඩත්තු කළ යුතුවාත් හැර, දේශීය වෛද්‍ය ආඥාපණත (105 වැනි අධිකාරය) යටතේ ලියාපදිංචි කරන ලද දේශීය වෛද්‍යවරයකු භාරයේ තැබිය යුතු ය.

2. (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වෛද්‍යවරයකු විසින් හෝ සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් කිසියම් නිලධාරියකු විසින් සභාව විසින් නියම කරනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලා සම්බන්ධයෙන් වූ ගණන් හිලව් පිළිබඳ යම් යම් පොත් පත් හා වෙනත් එබඳු සටහන් වාර්තා සභාව විසින් අනුමත කරනු ලබන යම් පිළිවෙලකට හා යම් විධියකට අනුව තැබිය යුතුය.

3. සභාව විසින් ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් කාර්‍ය්‍ය සභා පොදු අරමුදලින් අවුරුදු පතා ලැබ පරිහරණය කළ හැකි අතර එසේ පරිහරණය කිරීම සඳහා සභාවේ වාර්ෂික අය-වැය ලේඛනයෙන් හෝ වරින් වර කාර්‍ය්‍ය සභාව විසින් සම්මත කරගනු ලබන අතිරේක ඇස්තමේන්තු වලින් හෝ මුදල් වෙන් කළ යුතුය.

4. (5) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධි විධාන වලට යටත්ව, ආයුර්වේද බෙහෙත් ශාලාවේ රෝගීන් සඳහා නොමිළයේ ප්‍රතිකාර සැපයිය යුතුවාත් හැර එකී ප්‍රතිකාර හක්මන-වලකඩ ගම්කාර්‍ය්‍ය සභා ප්‍රදේශයේ පදිංචිකරුවන්ට සීමාවිය යුතුය.

5. ආයුර්වේද බෙහෙත් ශාලාවට සපයන ලද බෙහෙත් හා ඖෂධ වල වටිනාකමින් කොටසක් පියවාගැනීම සඳහා ආයුර්වේද බෙහෙත් ශලාවේ ප්‍රතිකාර කරන එක් එක් රෝගියාගෙන් ශත 50 බැගින් වූ ගාස්තුවක් සභාව විසින් අයකළ යුතුය. සභාපති විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් හෝ සභාව විසින් අනුමතකරන ලද ආකෘති පත්‍රයකින් රෝගියකුගෙන් අයකරනු ලබන එකී සෑම ගාස්තුවක් සම්බන්ධයෙන් ම වහාම කුවිතාන්සියක් නිකුත් කළ යුතුය. එකී සෑම කුවිතාන්සියකම කාබන් දෙවෙනි පිටපතක් තිබිය යුතුවාත් හැර ඒවායේ පිළිවෙළින් අංක යොදා තිබිය යුතුය.

6. සභාපති විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත්කම නිසා 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව ගෙවීමෙන් යම් රෝගියකු නිදහස් කළ හැකිය.

7. සභාපති විසින් දෙසැම්බර් මාසයේ 31 වැනිදැයින් අන්තිම වන එක් එක් අවුරුද්ද අවසානයේදී ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව පිණිස ලැබෙන මුදල් හා ඒ සම්බන්ධයෙන් වියදම් වන මුදල්ද පෙන්නුම් කරන සටහනක් සම්පාදනය කිරීමට සැලැස්විය යුතුය.

8. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ආයුර්වේද බෙහෙත් ශාලාව" යනුවෙන් සභාව විසින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව අදහස් වේ.

"සභාපති" යනුවෙන් සභාවේ සභාපතිතුමා අදහස් වේ.

"සභාව" යනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ හක්මන—වලකඩ ගම් ප්‍රදේශයේ ගම් සභාව අදහස් වේ.

12-291

---

ඇල්. ඩී.—බී 147/47
ප. පා. දෙ.—ජී 2/42

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ හොරවල-දෙඩන්ගොඩ-මතුගම ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹදීය.

#### අතුරු ව්‍යවස්ථාව

කළුතර දිස්ත්‍රික්කයේ හොරවල-දෙඩන්ගොඩ-මතුගම ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගන්නා ලදුව, 1940 නොවැම්බර් මස 22 දින, අංක 8,684 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව, එහි උපලේඛනය වෙනුවට පහත සඳහන් උපලේඛනය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

#### උපලේඛනය

| | |
|---|---|
| 1. කරත්තයක්, තිරික්කලයක්, රික්ෂා රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... ... | හො.දෙ.ම.වා. |
| 2. ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | හො.දෙ.ම.බ.ක. |
| 3. තනි ගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | හො.දෙ.ම.බ.බා. |
| 4. අත් කරත්තයක් සඳහා ... ... | හො.දෙ.ම.අ. |
| 5. ජින් රික්ෂා රථයක් සඳහා ... | හො.දෙ.ම.රි. |
| 6. බයිසිකලයක් සඳහා ... ... | හො.දෙ.ම.බ. |

12-281

ඇල්. ඕ.—බී 24/48
ඇල්. ජී. ඕ.—ජී 2/115

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාමිණියා කෝරළේ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ක්වූ නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹදීය.

#### අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. පහත දක්වෙන ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සලකනු ලැබිය යුතුය :—

1. ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
2. තොග ගණනේ හෝ සිල්ලරට හෝ විකිණීම පිණිස ඉක්මනින් නරක් වන ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
3. කොම්පෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම.
4. විනාකිරි සෑදීම.
5. සබන් සෑදීම.
6. දුම්කොළ වියළීම හෝ සකස් කිරීම.
7. හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම.
8. පුවක් වියලා සකස් කිරීම.
9. සතුන්ගේ ලේ හෝ මළකුණු උණු කිරීම.
10. සතුන්ගේ ඇට කටු හෝ හම් ගබඩා කිරීම.
11. රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම.
12. කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.
13. සෝඩා සෑදීම.
14. ලැලි පොංගවා සකස් කිරීම.
15. මාළු අයිස් දැමීම.
16. සුරුට්ටු, සිගරැට් හෝ බීඩි සෑදීම.
17. පැණි හෝ හකුරු සෑදීම.
18. ගෘහ භාණ්ඩ සෑදීම.
19. ගෝනි ගබඩා කිරීම.
20. කොහු වලින් හෝ කෙඳිවලින් සෑදූ භාණ්ඩ ගබඩා කිරීම.
21. තලතෙල් හිඳීම.
22. වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කිරීම.
23. හිස් බෝතල් ගබඩා කිරීම.
24. තෙල් වර්ග ගබඩා කිරීම.
25. වඩු මඩුවක් තබා ගැනීම.
26. දර මඩුවක් හෝ ලී මඩුවක් තබා ගැනීම.
27. දුම්කොළ ගබඩා කිරීම.
28. සබන් ගබඩා කර තැබීම.
29. උළු හෝ ගඩොල් ගබඩා කිරීම.
30. බෙලෙක් වැඩ පොලක් තබා ගැනීම.
31. මිනීපෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම.
32. වාර්නිෂ් හෝ තීන්ත වර්ග ගබඩා කිරීම.
33. පරණ ලෝහ භාණ්ඩ ගබඩා කිරීම.
34. පුන්නක්කු ගබඩා කිරීම.
35. සිමෙන්ති ගබඩා කිරීම.
36. සත්ව තෙල් සෑදීම.

2. පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සලකනු ලැබිය යුතුය :—

1. කොප්පරා සෑදීම.
2. තෙල් වලින් හෝ වෙනත් ඉන්ධනයකින් හෝ වාෂ්ප බලයෙන් හෝ විදුලිය බලයෙන් හෝ ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරනු ලබන යම් කර්මාන්තයක්.
3. කබුක්ගල්, බොරළු, කලුගල් ලබාගැනීමට වළවල් කැනීම.
4. මිනිරන් සකස් කිරීම හෝ ගබඩා කිරීම.
5. වළක් කැනීමෙන් හුණු ගල් ලබා ගැනීම.
6. හාල් මෝලක් හෝ වී කොටන යන්ත්‍රයක් තබා ගැනීම.
7. යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල් තෙල් සිඳීම.
8. සෙක්කුවකින් පොල් තෙල් සිඳීම.
9. කෙඳි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම.
10. කපු පුළුන් හෝ පිදුරු ගබඩා කිරීම.
11. බූමි තෙල් ගබඩාවක් තබා ගැනීම.
12. මුද්‍රණාලයක් තබා ගැනීම.
13. කපාපු පොල් සකස් කිරීම.
14. ස්වර්ණාභරණ සෑදීම.
15. අම්ලකර වායුව පාවිච්චි කරන ලෝකුරු වැඩ කිරීම.
16. අම්ලකර වායුව පාවිච්චි කරන ගරාජයක් තබා ගැනීම.
17. කොප්පරා ගබඩා කිරීම.
18. අඟුරු ගබඩා කිරීම.
19. කම්හලක් තබා ගැනීම.
20. අඟුරු ලබාගැනීම සඳහා පොල්කටු පිච්චීම.
21. ටයර් හා ටියුබ් වෝල්කනයිසින් කිරීමේ ස්ථානයක් තබා ගැනීම.
22. විදුලිය භාණ්ඩ සෑදීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් තබා ගැනීම.
23. යන්ත්‍රානුසාරයෙන් මිරිස් සහ කුළු බඩු ඇඹරීම සඳහා ස්ථානයක් තබා ගැනීම.
24. ගල් හෝ කළු ගල් පිපිරවීම.
25. ලී ඉරීම.
26. මෝටර් රථ හා ලොරි සේවා කිරීම සඳහා ස්ථානයක් තබා ගැනීම.
27. මෝටර් බයිසිකල් හා පදින බයිසිකල් සේවා කිරීම සඳහා ස්ථානයක් තබා ගැනීම.
28. වී, කුරක්කන් හෝ අන්කිසි ධාන්‍ය වර්ගයක් යන්ත්‍රානුසාරයෙන් ඇඹරීම.

3. පහත දක්වෙන ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සලකනු ලැබිය යුතුය :—

1. කෙඳි වර්ග සායම් කිරීම.
2. ගඩොල් හෝ උළු පිච්චීම.
3. බැටරි චාර්ජ් කිරීම.
4. හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම, හෝ කැබලි කිරීම.

12-290

---

ඇල්.. ඕ.—බී. 17/42
ප. පා. දෙ.—ජී 2/126.

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥ පණතේ 42 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ බද්දේගම ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන.

1962 නොවැම්බර් මස 27 වැනි දින.
කොළඹ දීය.

#### අතුරු ව්‍යවස්ථාව

ගාලු දිස්ත්‍රික්කයේ බද්දේගම ගම්සභාව විසින් සම්පාදිතව 1955 මැයි මස 27 වෙනි දින අංක 10,799 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධ අතුරු ව්‍යවස්ථා එකී "III" උප ලේඛනය වෙනුවට පහත දැක්වෙන උප ලේඛනය යෙදී මෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

#### උපලේඛනය

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂා රථයක් හැර ඕනෑම අන් දමක සෑම වාහනයක් සඳහා ... | බ.ග.වෙ |
| ඕනෑම අන්දමක සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | බ.ග.දෙ |
| සෑම තනි ගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් හෝ අත් කරත්තයක් සඳහා ... | බ.ග.ත |
| සෑම බයිසිකලයක් සඳහා ... | බ.ග.බ |

තහඩුවල පාට හා හැඩහුරුකම සභාපති විසින් නිශ්චය කරනු ලැබේ

12-280

ඇල්. ඩී.—බී 169/41
ප. පා. දෙ.—ජී 2/290

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 42 වෙනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කිරවැලි පත්තු (නැගෙනහිර සහ බටහිර) ගම් සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියේ (3) වෙනි උපවගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ක්වූ නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹදිය.

#### අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. පහත දැක්වෙන ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
(2) තොග ගණනේ විකිණීම පිණිස ඉක්මනින් නරක්වන ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
(3) කොම්පෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම.
(4) විනාකිරි සෑදීම.
(5) පුවක් වියලා සකස් කිරීම.
(6) සතුන්ගේ ලේ හෝ මළකුණු හෝ උණු කිරීම.
(7) සතුන්ගේ හම් හෝ ඇටකටු ගබඩා කිරීම.
(8) රබර් වියලා සකස් කිරීම හෝ සෑදීම.
(9) සෝඩා සෑදීම.
(10) සබන් සෑදීම.
(11) ලැලි පොඟවා සකස් කිරීම.
(12) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ශෝනි තුනකට වඩා ගබඩා කිරීම.
(13) කුකුළු, තාරා ආදී පක්ෂීන් විකිණීම පිණිස කඩයක් හෝ ස්ථානයක් තබා ගැනීම.
(14) සුරුට්ටු සෑදීම.
(15) බීඩි සෑදීම.
(16) පැණි හෝ හකුරු සෑදීම.
(17) මාළු අයිස් දැමීම.
(18) රා එකතු කරන ස්ථානයක් තබා ගැනීම.

2. (1) පහත දක්වෙන ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) තේ කර්මාන්ත ශාලාවක් තබා ගැනීම.
(2) කොප්පරා වියලීම හෝ ගබඩා කිරීම.
(3) යන්ත්‍රෝපකරණ වලින් පොල් තෙල් සිඳීම.
(4) කබොක්, බොරළු හෝ කළු ගල් ලබා ගැනීමට වළක් හෑරීම.
(5) පිදුරු ගබඩා කිරීම.
(6) කපාපු පොල් වියලා සකස් කිරීම.
(7) මිණිරන් වියලීම හෝ ගබඩා කිරීම.
(8) වලක් කැනීමෙන් හුණු ගල් ලබා ගැනීම.
(9) සෙක්කුවකින් පොල් තෙල් සිඳීම.
(10) දරමඩුවක් තබා ගැනීම.
(11) භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම.
(12) මුද්‍රණාලයක් තබා ගැනීම.
(13) ස්වර්ණාභරණ සෑදීම.
(14) හාල් මෝලක් හෝ වී කොටන යන්ත්‍රයක් තබා ගැනීම.
(15) කෙදි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම.
(16) කම්හලක් තබා ගැනීම.
(17) අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කරන ගරාජයක් තබාගැනීම.

3. පහත දක්වෙන ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) ගඩොල් හෝ උළු පිළිස්සීම.
(2) බැටරි චාජ් කිරීම.
(3) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, වියලීම හෝ කැබලිවලට කැඩීම.
(4) කෙදි සායම් කිරීම.

12-278

---

ඇල්. ඩී.—බී 130/40
ප. පා. දෙ.—ජී 2/296.

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ඕතර-ගම්දොලහ පත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවසථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹදිය.

#### අප්‍රසන්න හා අන්තරාදයක ව්‍යාපාර සම්බන්ධ අතුරු ව්‍යවසථා

1. පහත දක්වෙන ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම,
(2) තොග ගණනේ හෝ සිල්ලරට විකිණීම පිණිස නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම,
(3) විනාකිරි සෑදීම,
(4) සබන් සෑදීම,
(5) හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම,
(6) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම,
(7) සුරුට්ටු, සිගරැට් හෝ බීඩි සෑදීම,
(8) දරමඩුවක් හෝ ලීමඩුවක් තබාගැනීම.

2. පහත දක්වෙන ව්‍යාපාර අන්තරාදයක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) කොප්පරා වේලීම හෝ ගබඩා කිරීම,
(2) වී මෝලක් හෝ හාල් පාගින යන්ත්‍රයක් තබා ගැනීම,
(3) යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිඳීම,
(4) සෙක්කුවකින් පොල්තෙල් සිඳීම,
(5) භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම,
(6) කපාපු පොල් සෑදීම,
(7) සවර්ණාභරණ සෑදීම,
(8) ලෝහ කම්මලක් තබා ගැනීම,
(9) කෙදි වර්ග නිපදවීම හෝ ගබඩා කිරීම,
(10) මෝටර් රථ අළුත්වැඩියා කරන ස්ථානයක් තබා ගැනීම,
(11) බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් තබා ගැනීම,
(12) ලී ඉරන මෝලක් තබා ගැනීම.

3. පහත දක්වෙන ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) කෙදි වර්ග සායම් කිරීම,
(2) ගඩොල් හෝ උළු පිළිස්සීම,
(3) බැටරි චාජ් කිරීම,
(4) හුණුගල් පිළිස්සීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම.

12-275

ඇල්. ඩී.—බී 8/49
ප. පා. දෙ.—ජී 2/213

## ගම්සභා ආඥාපනත

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ යටිපළාත ගම්සභාව

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ නුවර එළිය දිස්ත්‍රික්කයේ යටිපළාත ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා කෙරෙහි පැවරුන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ක්වූ නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹදීය.

### මුදල් ණයට දීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. සභාපතිගෙන් ඒ සඳහා විධිමත් පරිදි ලබාගත් බලපත්‍රයක් පිට මිස, කිසිවකු විසින් යටිපළාත ගම් ප්‍රදේශය ඇතුළත මුදල් ණයට දීමේ ව්‍යාපාරයක නොයෙදිය යුතුය. එබඳු සෑම බලපත්‍රයක්ම, එය කලින් අවලංගු කරණ ලද්දේ නම් හැර එය නිකුත් කරන ලද අවුරුද්දේ දෙසැම්බර් මස තිස් එක් වැනිදාට අවසන් විය යුතුය.

2. සභාපති විසින් මුද්දර තබා, අත්සන් කරනු ලැබීම පිණිස නිසි ලෙස අංක යෙදූ දිනපොතක්ද, ලෙජරයක් හා කුවිතාන්සි පොත්ද යම්කිසිවකු විසින් ඉදිරිපත් කර සිටිතොත් හැර, මුදල් ණයට දීමේ ව්‍යාපාරයක යෙදීම පිණිස බලපත්‍රයක් ලබා ගැනීමට කිසිවකුට අයිතිවාසිකමක් නැතිවිය යුතුය.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම, ඒ සඳහා ගම්සභාව විසින් සපයනු ලබන ආකෘති පත්‍රයකින් ඉදිරිපත් කර සිටිය යුතුවත් හැර එය—

(අ) අලුත් බලපත්‍රයක් සඳහා නම්, ව්‍යාපාරය ආරම්භ කිරීමට අදහස් කරන දිනයට මත්තෙන් දින තිහකට නොඅඩුවූ දිනයකද,

(ආ) දැනට තිබෙන බලපත්‍රයක් අලුත් කිරීමක් සඳහා නම් එකී බලපත්‍රය අලුත්වැඩියා කිරීම අවශ්‍යව තිබෙන අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර් මස පළමු වැනිදා හෝ ඊට මත්තෙන්, ද

සභාපති තුමා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

4. උගස්වලට, පොම්සරි නෝට්ටුවලට හා ණයවද දෙන ලද සියලුම මුදල් පිළිබඳව මීට යාකොට ඇති උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රයට සාරානුකූලව අර්ධ වාර්ෂික වාර්තා සැපයීම බලපත්‍රධාරියාගේ යුතුකම විය යුතුය. මේ අර්ධ වාර්ෂික වාර්තාව එක් එක් අවුරුද්දේ ජනවාරි මස 15 වැනිදා හා ජූලි මස 15 වැනිදා හෝ ඊට මත්තෙන් සභාව වෙත ලැබිය යුතුය.

5. බලපත්‍රධාරියා විසින් සභාපතිට හෝ ඔහු විසින් ලියවිල්ලකින් අවසර දෙන ලද යම් කිසිවකුට වරින්වර ගණන් පිළිබඳ පොත්පත් පරීක්ෂාකර බැලීමට අවසර දිය යුතුවත් හැර, ඒ සඳහා ඔහුට අවශ්‍ය විස්තර තොරතුරු සැපයීමෙන් වුවමනා කරන සියලුම ආධාර දිය යුතුය.

6. මුදල් ණයට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම පිළිබඳ බලපත්‍රයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් 100ක් විය යුතු අතර, එය සෑම වර්ෂයකම මාර්තු මස තිස් එක් වැනිදාට මත්තෙන් ගෙවිය යුතුය.

